15/05/2011 - ඉරිදා ලංකාදීප

**සම්බුද්ධත්ව ජයන්තිය සමග විනය සංගායනාවක් පවත්වමු - මිලින්ද මොරගොඩ**

බුදුන් වහන්සේ ජන්මලාභය දුන් භාරතයටත් වඩා බුද්ධ දර්ශනය වසර පන් දහසක් කල් පවතින්නේ ශ්‍රී ලංකාවේ බවට මෙරට බෞද්ධ මහජනතාව තුළ විශ්වාසයක් ඇත. ශ්‍රී ලංකාවාසී බහුතරය බුදුන් සරණ ගිය බොදුනුවන්ය. අපි අපගෙන්ම ප්‍රශ්න කරමු. බෞද්ධයන් ව ඇත්තේ උපතින්ද? යථාවාදී ලෙස බුද්ධ දර්ශනයේ හරය ගැන අවබෝධයක් අපට තිබේද? මෙම ප්‍රශ්නයට අවංකව හදවතට එකඟව දෙන පිළිතුර ගැන අපටම හැඟීමක් ඇත. බොදුනු ප්‍රජාවක් සේ පෙනී සිටින බහුතරයක් එය ආරක්ෂා කරන්නේ නමට පමණකි. පදක්කමක් සේ පැළැඳ, බෞද්ධකමට මුවා සිටින අප බුදු දහමේ එන මැදුම් පිළිවෙත කුමක්දැයි ප්‍රායෝගිකව අධ්‍යයනය කරන්නේ නැත. බුදුදහමේ හරය වෙනුවට එහි මතුපිටින් ඇති ලක්ෂණ වලට පමණක් අදහන පිරිසක් බවට අපි පත්ව වී සිටින්නෙමු.

පස් පව්, දස අකුසල් දන්නා බොදුනු සමාජය නිති පන්සිල් ගනිති. පන්සිල් ආරක්ෂා කරන්නට උනන්දු වන පිරිස කොතරම් අල්ප ද? පොහොය දිනක හෝ වෙනත් බෞද්ධ උත්සවයක් අවස්ථානයේ විහාරස්ථානයේ ගැවසෙන පිරිස විශාලය. මේ උක්සව අතර මුල් තැන ගන්නේ බුද්ධ දර්ශනය අනුව ජීවිතය ගත කරන බහුතරයක් බව ඉඳුරා කිව හැකිද? කොකළ යුතු වෙළඳාම් හෝ සාධාරණ දිවි පෙවෙත ගැන දන්නා නමුත් ඒ වෙනුවෙන් කැපවන්නට වැඩි දෙනෙක් උනන්දු නොවෙති. මේ අපි ජීවත් වන සංකීර්ණ සමාජයේ යථාර්ථයයි. දැන දැනත්, නොදැනත් නොකළ යුතු දේ කරන්නට සූදානම් පිරිසක් ජීවත් වන දේශයයි. අප ගැන අවංක අදහසක් පළ කරන්නේ අවඥාවෙන් නොව, මෙම ඇත්ත දැන ගැනීමෙන් පසු අපට නිසි මගට පිවිසෙන්නට අවස්ථාව ඇති නිසාය. බෞද්ධකම බුදු පිළිවෙත ගැන විශේෂ අවධානයක් ඇතිව පුලුල් කතිකාවතක් ආරම්භ වී ඇති මෙම වකවානුව මේ ගැන නැවත ගැඹුරෙන් සිතා බැලීමට සුදුසු ම කාලයයි.

'' මිනිහාත් හදා ගනිමින් රටත් හදා ගනිමු '' යන පණිවුඩය පදනම් කර ගෙන ශ්‍රී ලාංකිකයන් අතර පුළුල් මතයක් ඇති කළ අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහ නාහිමියන් ''බෞද්ධ ගෙදර'' නමින් කෘතියක් රචනා කර සිල්වත් සමාජය අතට පත් කළේය. එයින් උපුටා ගත් පහත දැක්වෙන කොටස පෙන්නුම් කරන්නේ අපේ යථා ස්වභාවයයි.

***''බෞද්ධයන් වෙසෙන ගෙදර බෞද්ධ ගෙදර නම් වේ. මෙහි බෞද්ධයන් යයි කීවේ නමින් නොව ක්‍රියාවෙන් හා ගුණයෙන් බෞද්ධ වූවනටය. බෞද්ධ නාමයක් තුබුණු පමණින් හෝ බෞද්ධ කුලගෙයක උපන්, හැදුණු, වැඩුණු පමණින් හෝ බෞද්ධ දෙමවුපියන්ගේ දරුවකු වූ පමණින් හෝ කෙනෙක් බෞද්ධ නොවෙති. බෞද්ධ ගෙයක උපන් පමණින් බෞද්ධයා යැයි කියනවා නම් බෞද්ධ ගෙ වල උපදින තිරිසන් සතුන්ට ද, ''බෞද්ධ බල්ලෝ, බෞද්ධ බළල්ලු '' යයි කිව යුතු නොවේද? බෞද්ධ ගෙදරක හැදුණ වැඩුණු පමණින් හෝ බෞද්ධයා යැයි කියනවා නම් බෞද්ධ ගෙවල හැදෙන වැඩෙන ගස් වැල් ආදියට ද, '' බෞද්ධ වම්බොටු - බෞද්ධ මිරිස '' යයි කිව යුතු නොවේද? එය එසේ නොකියනුවා නම් යටැ කී කරුණු අනුව පමණක් කෙනෙකුට බෞද්ධයා යයි කියන්නේ කෙසේද? එය කිසිසේත් සුදුසු නැත. එහෙයින් බෞද්ධයා යැයි කිව යුත්තේ බෞද්ධ ප්‍රතිපත්ති ඇත්තන්ටමය. තෙරුවන් සරණ ගිය බෞද්ධයෙකුට අඩුම ගණනේ පන්සිල් හා ශ්‍රද්ධා-ශීල-ශ්‍රැත-ත්‍යාගාදී ගුණයන් වත් තිබිය යුතුය. එබඳු බෞද්ධ ප්‍රතිපත්තීන් ගෙන් යුක්ත තැනැත්තන් වාසය කරන ගෙදර බෞද්ධ ගෙදර වේ. ''***

මෙම පණිවුඩයෙන් කියන්නේ සමාජ යථාර්ථයයි. මෙම තත්ත්වයට පත්වූයේ කෙසේද? මෙරට සමාජය විදේශීය ආක්‍රමණ හෙයින් වහල් ව වසර පන්සියයක කාලයක් ගත කර ඇත. සමාජය හා ජනතාව අබෞද්ධ අධ්‍යාපනයෙන්, අබෞද්ධ සංස්කෘතියෙන් සංකර ගතිවලට හුරු විය. මේ කාලය තුළ බුද්ධ දර්ශනයෙන් ලැබුණ ආලෝකය යටපත්විය. විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව සමග සමාජය එයින් ලබා ගෙන ඇත්තේ එහි ලෞකික පැත්ත පමණකි. සමාජය තව තවත් සදාචාරයෙන් ඈත්ව තිබේ. බුද්ධ දේශනාව තුළ වැසියන්ට, පාලකයන්ට, නොයෙකුත් වෘත්තීන්හි යෙදෙන්නන්ට ආදී වශයෙන් ලෞකික ජීවිතයට වැදගත් මග පෙන්වීම නොඅඩුය. දහමට නැඹුරු මහා සංඝරත්නය විශයෙහි සමීප බොදුනු ජනතාව මේ බව දනී. නමුත් පෙනෙන්නට ඇති ප්‍රධානම කරුණ මේ සත්‍ය ජීවිතයට

ප්‍රායෝගිකව භාවිතයට නොගැනීමයි. පොදුවේ අප සියලුදෙනාම මෙකී ඇත්ත ගැන නිසි අවබෝධයකින් යුක්තය.

අද සමාජය තුළ සදාචාරය යට වී දුරාචාරය මතු වන විට එය විශාල කනස්සල්ලකට කරුණකි. පිරිහීමට හේතුවකි. පන්සිල් යට පත් කරගෙන පස් පව් වල නිරත වන අවස්ථාවන්හි ඇතමෙකුට එය ආඩම්බරයට හේතු වී ඇති බව අපට පෙනේ. සියලු නොකළයුතු දේ කරන අතරතුර ඉතා ජේත්තුවට සමාජය හමුවට පැමිණෙන අවස්ථාවේ නින්දා ගැරහුම් වෙනුවට සාදර ගෞරව ඇතිව පිළිගන්නට තරම් සූදානමක් ඇත්නම් අප කොතරම් පිරිහී සිටින රටක් ද?

මේ සියල්ල වෙනස් කර අලුතින් සිතන්නට අපට අවශ්‍යව තිබේ. ජීවිතයට සමීප බුද්ධ දේශනාවේ හරය දියුණුවට උපයෝගී කර ගන්නටත්, යථාවබෝධයෙන් පිරුණ සමාජයක් තුළින් දැහැමි, විනීත අනාගතයකුත් සකස් කර ගත යුතුය. අද රටට අවශ්‍ය වී ඇති අලුත් අවස්ථාව හා ඒ වෙනුවෙන් දර්ශනයක් ගොඩනගා ගැනීම ඉදිරියේ අපට අතිශයින් වැදගත් මොහොතක් උදා වී තිබේ. එය 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තියයි. ''පිළිවෙතින් පෙළ ගැසෙමු'' යන අනගි පාඨය පදනම් කරගනිමින් තවත් දින කිහිපයකින් උදාවන වෙසක් පුන් පොහෝ දිනයේ දී එකී සම්බුද්ධත්ව ජයන්තිය සමරන්නට ශ්‍රී ලාංකේය සමාජය සූදානම්ය. පිළිවෙත ඇති කළ යුතු උත්සව සැරසිලි වලට පමණක් නොවේ. පිළිවෙත ඇති කර ගත යුත්තේ ජීවන ගමනටය. අප අනුගමනය කළ යුතු බුදු රජානන් වහන්සේ දේශනා කළ ප්‍රතිපත්තිය. පිළිවෙතින් පෙළගැසීම ආගමික සංකේතයක් වශයෙන් සැලකීමට වඩා පිළිවෙතින් පෙළ ගැසීම සමස්ථ රටවැසියාගේම අවශ්‍යතාවයක් බව තේරුම් ගැනීම වැදගත්ය.

සිදුහත් කුමරු ගිහි ගෙයින් නික්ම ගියේ උදාර පරමාර්ථයක් ඇතිවය. එහි තිබුණේ එක අරමුණකි. සියලු දුක නැති කරන නිවන අවබෝධ කර ගැනීමයි. ඉපදීම, මරණය දුකක් බව බෝසත් කුමරු අවබෝධ කර ගත්තේ තමන් ට අහන්නට දකින්නට ලැබුණ සිදුවීම් සමගය. ධර්මය අවබෝධ කර ගැනීමට අප්‍රමාණ වෙහෙසක් දරන්නට බෝසතානන්ට සිදුවිය. සිරුරට අප්‍රමාණ දුක් දුන්නේය. අපේක්ෂාකළ නිසි අවබෝධය හිමි නොවිණ. කැපවීමේ අන්තයටම ගමන් කළේය. සිරුරට දුක් දීමෙන් යථාවබෝධය නොලැබෙන බව දැන මැද මාවතට අවතීර්ණ විය. උපේක්ෂා සගහත විය. බෝසතාණෝ එහි කෙළවර නියම සත්‍යය අවබෝධ කරගන්නට සමත් වූහ. දුක, දුක ඇතිවීමට හේතුව හා දුකින් මිදෙන මාවත අනාවරණය කර ගත්හ. සියලු කෙළෙස් දුරු කිරීමෙන් නැවත ඉපදීමක් නැති නිවන අවබෝධ කර ගත හැකි බව පසක් කර ගත්හ.

වර්තමානයේ අප මුහුණ පා සිටින අර්බුදවලට හේතුව කුමක්ද? මෙම බුදු දහමේ යථාර්ථය හඳුනා නොගැනීමයි. අප ගමන්කරන්නේ අන්තවාදයටය. එහි ඉවසීම නැත. කෙලෙස් බරින් පිරී ඇත. සිත් තුළ ඇත්තේ තන්හාව හා ආශාවයි. කැපවීම නැත. අනුන්ගේ දුක නොහඳුනයි. පුද්ගල විනය හා විශ්වාසය පිරිහී ඇත. මෙම පුද්ගල පිරිහීම පුද්ගල නියෝජනයෙන් සැදුන සමාජ සංස්ථාවන්ට ද කාන්දු වී ඇත. එකී ආයතන වල මහජනතාවගේ නියෝජිතයන් ද පිරිහීමකට ලක්කර තිබේ. ආණ්ඩු හා එහි පනවන ලද නීති රීති බිඳ වැටී ඇත. අවංකත්වය, ගෞරවය, මධ්‍යස්ථභාවය වැනි ජනසමාජය ගරු කරන වටිනාකම් නැවතත් ඇති කිරීම ප්‍රශ්නයක් වී ඇත.

නීතියට පමණක් සියල්ල කරන්නට හැකියාවක් නැත. නීති පනවා සමාජය යහමගට ගන්නට හැකි නම් ඉහළම දඬුවම් ඇති රටවල් විකෘති තත්ත්වයන්ට ගොදුරු වන්නේ නැත. අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයට දීර්ඝ කාලයක් පත්ව සිටීමෙන් අපගේ අනන්‍යතාව මිශ්‍ර වී ඇත. ජනතාවගේ කැමැත්ත හෝ පිළිගැනීම අනුව පැවති පරිපාලන රටාව වෙනුවට අද පවතින්නේ බටහිර විසින් පනවන ලද පාලන ක්‍රම ය. යම් යම් සංශෝධන තිබිය හැකිය. එනමුත් මූලික රාමුව නොවෙනස්ය. බුදු දහමෙන් රාජ්‍ය පාලනය පිළිබඳව දැක්මක් දී තිබේ. මධ්‍යස්ථව ජීවිතය ගත කිරීම සඳහා ගත යුතු මාවත බුද්ධ දේශනාවේ ඇතුළත්ය. බුද්ධ දේශනාවේ දර්ශනය හරය සේ ගෙන ගැළපෙන පරිපාලන රටාවක් සකස් කර ගත හැකිය. බටහිර පනවන ලද නීති රීති තවදුරටත් පවත්වාගෙන ආර්ථික, ත්‍රස්තවාද හා සමාජ ප්‍රශ්න බොහෝ ප්‍රමාණයකින් මිරිකී සිටින වත්මන් සමාජයේ පෙර පැවති උසස් ධර්මතා අලුත් රාමුවකින් අනුගමනය කරමින් සමාජ ප්‍රශ්න විසඳා ගන්න උත්සාහ කළ යුතුය. බටහිර පනවන ලද න්‍යාය විසින්, ප්‍රශ්න ඇති කර ඒවා අර්බුද බවට පත් කර තිබේනම්, පෙරදිග කලාපයෙන් ලෝකයට

ගෙන ගිය මැදුම් පිළිවෙත පදනම් කරගත් අලුත් සමාජ පාලන රාමුවක් සකස් කර ගැනීම කෙරෙහි අප අවධානය යොමු කළ යුතුය.

බුද්ධ දේශනාවේ තවත් තැනෙක උපයන ධනය පරිභෝජනය, නැවත ආයෝජනය හා මතු අවශ්‍යතා වෙනුවෙන් ඉතිරි කරන අන්දම පෙන්වා දී තිබේ. මෙම ධර්මානුකූල පිළිවෙතට ඇතුළුවී සිටින්නට හැකි වූයේ නම් අද සමාජයට ආර්ථිකය බරපතල ගැටලු ඇති නොවේ. කෙනෙකුගේ උසස් හෝ පහත් වන්නේ උපතින් නොව ඔවුන් ගේ ක්‍රියාව අනුව බව බුද්ධ දර්ශනය මනාව පැහැදිළි කරයි. නමුත් අද සමාජයේ සැළකිලි ඇත්තේ පෙළපත අනුවය. ඉගෙනගත් පාසල අනුවය. ධනය හා වත් පොහොසත් කම් අනුවය. මේ බෙදීම් ඇති කළේ බුදු දහම නොවේ. පාලනයේ පහසුව උදෙසා සමාජය බෙදා වෙන් කරන ලද අතර පංති පරතරය පවත්වාගෙන ගියේය. එහි ප්‍රතිවිපාක අනුව සාමාන්‍ය ජනතාවට යුක්තිය ඉටු නොවන අතර සාධාරණ සමාන අවස්ථා අහිමි වී තිබේ. එහි ප්‍රතිඵලය ත්‍රස්තවාදය ඇති වීමයි. සමාජය යහපත්නම්, එහි සාධාරණ අවස්ථා තිබේනම් ආණ්ඩු විරෝධය ඇති නොවේ. බුදු දහම උගන්වන පණිවුඩය එයයි. මෙකී දර්ශනය ප්‍රජාව හමුවේ තබන්නට අපට හැකිවිය යුතුය. පිළිවෙතින් පෙළ ගැසිය යුත මෙම මූලික හරය අනුව ජීවත්වීමටය. දෙදහස් හයසිය වැනි සම්බුද්ධත්ව ජයන්තිය සමරන මේ අවස්ථාවේ බුදු දහමට ගරු කරන, ඒ අනුව ජීවිතය සකස් කරගෙන සිටින අප අවංකවම අපගේ ශක්තිය ගැන නිසි තක්සේරුවකට යා යුතුව ඇත. සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා සමස්ත බෞද්ධ ජනතාවට ආගමික දර්ශනය බෙදා දීම උදෙසා එකමුතු විය යුතුය.

සිවිල් සමාජය පිරිහීමකට ලක්ව ඇති අවස්ථාවක සුපිරිසිදු බුදු දහම දක්වා මහජනතාව අවදි කළ යුතු සංඝ සමාජයයි. එනමුත් සංඝ සමාජයේ ද නොයෙක් බෙදීම් ඇත. අඩු ලුහුඬුකම් හා ශාසන හිතකාමී නොවන සිදුවීම් වාර්තා වෙයි. බෞද්ධාගමේ පමණක් නොව, වෙනත් ආගම්වල ද කලින් කල මෙවැනි පිරිහීම් හා පිබිදීම් ඇතිවෙයි. බුද්ධ දර්ශනය ප්‍රභාවත් කිරීම වෙනුවෙන් නිසි තීන්දුවලට එළැඹීමේ වගකීමක් ත්‍රෛනිකායික මහ නාහිමිවරු ප්‍රධාන මහා සංඝරත්නයට ඇත. බුද්ධ ශාසනයේ පරිහානියට හේතු වී ඇති බව පෙනුණ මෑත කාලීන අවස්ථා ගණනක දී සංඝාධිකරණය හා කතිකාවතක් ඇතිකිරීම මගින් නිවැරදි මගට ගැනීමට ඇති හැකියාව සාකච්ඡාවට බඳුන්විය. එනමුත් ඒවායේ සාරගර්භ යෝජනා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූ බවක් පෙනෙන්නට නැත. ගිහි සමාජය මෙකී යෝජනා හා සංවාද මහත් උපෙක්ෂා සහගතව බලා සිටි අතර එමගින් වසර දහස් ගණනක් තුළ සමාජ පරිවර්තනය සමග බුද්ධ ධර්මයට මුසුවූ නොයෙකුත් අවභාවිතා නිවැරදි වනු ඇතැයි අපේක්ෂා කළහ.

ඉතිහාසය අනුව බුදුරජාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වීම සමග මාර්ග ඵල අවබෝධකරගෙන නොසිටි සංඝරත්නය අතර ඇතිවූ ශාසනික ගැටලු පළමු ධර්ම සංගායනාවට හේතු විය. විනය පිටකයට අයත් චුල්ල වග්ගය එය සඳහන් කරන්නේ සුභද්‍ර නම් හිමි නමක්, කරන ලද ප්‍රකාශයකට පසු මහා සංඝරත්නය විසින් සංඝ සමාජයේ පැවැත්ම අභියෝගයනට ලක්වන ලකුණු දැක මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පළමු සංගායනාව පවත්වන ලද බවය. දෙවනුව බුදු රජාණන්වහන්සේගේ පිරිනිවන් පෑමෙන් සියවසරකට පසුව ද, තෙවැන්න මොග්ගලී පුත්තතිස්ස මහ රහතන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් පාටලී පුත්ත නගරයේ දී ද ධර්ම සංගායනා පැවති බව මහාවංශයෙහි සඳහන්ය.

ධර්ම සංගායනාවට මුල්වී ඇත්තේ එකී පරිහානීය හේතු මැඩ යළි පුනර්ජනනීය ශක්තිය ලබා ගැනීමයි. එය සාර්ථක වූ බවට සැකයක් නැත. දර්ම සංගායනා පවත්වන්නට වැඩි වෙහෙසක් ගෙන ඇත්තේ පිරිසිදු බුදු දහම ආරක්ෂාකර ගැනීමේ අරමුණෙනි. පොත පත ලියැවී ඇති හා දැන් වන විට බුද්ධ ධර්මය අන්තර් ජාලයට ද එකතු වී ඇති අවස්ථාවක ධර්මය විකෘති විය හැකි අවදානම අඩුය. අතීතයේ කටපාඩම් කිරීමෙන් ධර්මය ආරක්ෂා කරන ලද යුගයේ දී වචන ගිලිහීම් හා වෙනස් ප්‍රවාද එකතුවීම් වාර්තා වී තිබේ. නමුත් අද තාක්ෂණයේ දියුණුව හෙයින් බුදු දහම තවත් කාලාන්තරයකට පවත්වාගත හැකිව තිබේ.

වර්තමානයේ බුද්ධ ශාසනය අභියෝගයකට ලක්ව නැතැයි කිව නොහැකිය. අභියෝගය එල්ල වී ඇත්තේ ධර්මයට නොවේ. විනයටය. විනය පරිහානියක් දැක ගත හැකිය. සසුන් ගතවන නවක

හිමිපාණන් වහන්සේලා සංඛ්‍යාවෙන් සීමාසහිතවීම පමණක් නොව ධර්ම ශාස්ත්‍රීය ගවේෂණයෙන් අග තැන්පත්වන්නට වර්තමාන තරුණ හිමිපාණන් වහන්සේලා උනන්දු නොවීම ද මහා ශාසනික ගැටලුවකි. සංඝරත්නය දේශපාලනයට අවතීර්ණවීමත් අනතුරුව මහ මැතිවරණයට ඉදිරිපත්වීමත් දක්වා ගමන් කිරීම ගැනත් සමාජයේ විවිධ අදහස් තිබේ. විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව සංඝ සමාජය තුළටත් ඇතුළු වී ඇත. සමාජ දියුණුව සමග මහා සංඝරත්නය නොයෙකුත් වෘත්තීන් හි නියැලෙයි. දැනුමෙන් පොහොසත් වන අතරතුර ඒ දැනුම යළි මහජනතාවට බෙදා දෙන ආකාරය ගැන ගැටලු තිබේ. අරණ්‍යගත භික්ෂු වහන්සේලා අදටත් මුදල් පරිහරණය නොකරති. ගසකින් අත්තක් පවා කඩා නොදමති. එළවලු, පළතුරු හා ධාන්‍ය මගින් පමණක් යැපෙන සංඝයා වහන්සේලා ද සිටිති. මේ අතර බුදු රජාණන් වහන්සේ විසූ යුගයට හාත්පසින් ම වෙනස් ලෞකික දේ සමාජයේ පරිහරණය වෙමින් තිබේ. දුරකථනය, පරිගණකය, යාන වාහන, රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර මෙයින් සමහරකි. සංඝරත්නයට මෙවැනි දේ අකැප ද? කැප වන්නේ කෙසේ ද? යන්න විනය කතිකාවතකින් සාකච්ඡා කළ හැකිය. මෙරට ඇතැම් වෙහෙර විහාරස්ථාන මලයාලි ගුරුකම් හා යකැදුරුකම් කරන මධ්‍යස්ථාන බවට පත්ව තිබේ. කේන්දර බැලීම් යන්ත්‍ර මන්ත්‍ර කටයුතු වල නිරත වීම් යනාදී වශයෙන් මහා සංඝරත්නය නිරත විය යුතු යැයි බොදු ජනතාව අපේක්ෂා නොකරන අංශ කෙරෙහි අවතීර්ණ වී තිබේ. තවත් තැනෙක වෘත්තීය විහාරස්ථානයේ ඉඩ කඩ වෙන්කරගෙන එහි නොයෙකුත් බාහිර ව්‍යාපාර හා අධ්‍යාපන සේවා පවත්වන අවස්ථා දැක ගත හැකිය. නීති වෘත්තියට ඇතුළුවීම හා රියැදුරු බලපත්‍ර ලබා ගැනීම යනාදී ගිහි සමාජයට සීමා වූ අංශ කෙරෙහි ඇතුල් වන්නට භික්ෂූන් වහන්සේලා යෝජනා කරති. මේවා සුදුසුද? නුසුදුසු ඇයි? සුදුසුනම් එය කළ හැකි පිළිවෙත කුමක්ද? විමසා බැලිය යුතුය. එය කළ හැකි වන්නේ කතිකාවතක් මගින් පමණකි. විනය සංගායනාවක, කතිකාවතක අවශ්‍යතාව අද තදින් දැනේ.

ශාසනික පැවැත්ම, විහාරස්ථානයන්හි පවතින අඩුපාඩු සම්බන්ධව ද නොයෙකුත් අදහස් මතුවී ඇති බව ද පිළිගත යුතුය. නගරබද විශාල වශයෙන් සම්පත් ඇති දායක සභා ඇති විහාරස්ථාන හා ඉතා දුර බැහැර දාන වේල සපයා ගැනීමට ද දුෂ්කර විහාරස්ථාන ගැන ද නොයෙකුත් විවේචන ඉදිරිපත්ව තිබේ. පිලිවෙතින් පෙළ ගැසෙන පණිවුඩය නිකුත් කරන මෙම සම්බුද්ධත්ව ජයන්තිය අවස්ථාවේ දී පවා ධර්මය ආරක්ෂා කිරීමට, බුදු දහම නගා සිටුවීමට වඩා බාහිර සාටෝප වලට මුල් තැන දී තිබේ. මෙයට කලින් ද වතාවක් සම්බුද්ධත්ව ජයන්තිය අර්ථවත් කිරීම උදෙසා විනය සංගායනාවක් ඇති කිරීමෙහි වැදගත්කම පෙන්වා දී ඇත. වගකිවයුත්තන් ඒ කෙරෙහි නිහඬය. රජය පවා උනන්දු වන්නේ මතු පිටින් පෙනෙන උත්සව පවත්වා මන්දිර ඉදිකර ධනය වැය කරන උපාය කෙරෙහි පමණකි. වඩා බැරෑරුම් අවධානයකට ලක්විය යුත්තේ බුද්ධ ධර්මය නොයෙකුත් බාහිර සාටෝප එකතු වී එහි යථාවබෝධයට වඩා බාහිරාලංකාරය කෙරෙහි අවධානය යොමුවීම ගැනය. බුද්ධ දේශනාවේ හරය යටපත්කර එහි මතුපිට ආගමික හැඟීම පමණක් ඉදිරියට ගෙන එන කුප්‍රකට අන්දම පිළිබඳවය.

මිහිඳු මාහිමියන් මිහින්තලාවට වැඩමකර අලුතින් ලාංකික සමාජයට බෙදා දුන් දැක්ම රටට අනන්‍ය කර ගන්නට අපි සමත් වීමු. ශ්‍රී ලාංකේය අනන්‍යතාව සමග වර්තමානයේ බුදු දහම ජාත්‍යන්තරයට යොමු කරන්නට ද අපි සමත්ව සිටිමු. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි බිමටත් වඩා බුදු හිමියන්ගේ දැක්ම හා භාවිතාව දක්නට ලැබෙන්නේත් ආරක්ෂා වී ඇත්තේත් ශ්‍රී ලංකාවේය. එය සුවිශේෂී කාරණාවකි. සත්‍යයට මුහුණ දෙන්නටත්, එය සමාජයට ගැළපෙන ලෙස යථාර්ථවාදී පදනමක් ලෙස සකස් කරගැනීමේ අභියෝගයටත් අතීතයේ දී අප සාර්ථකව මුහුණ දී ඇත. යථාර්ථය හඳුනාගෙන නව දැක්මක් බිහි කරන්නට පමණක් නොව එය සාර්ථකත්වය සේ හුවා දක්වා බුදු දහම සේම මෙරට දැක්ම තවත් සමාජයකට පදනමක් සේ පිරිනමන්නට හැකි යුගයක් වෙනුවෙන් අලුතින් සිතන්නට අවශ්‍යය. අභියෝගය සුපිරිසිදු නිර්මල බුදු දහම තවත් දෙදහස් පන්සිය වසරක් පවත්වාගෙන යාමය. ඒ උදෙසා වරින්වර පවත්වන සංගායනා මහෝපකාරීවන බව නිසැකය. ධර්මයෙහි සැක පලුදු තැන් හා විනය සම්බන්ධයෙන් පොදු සිද්ධාන්ත ගොඩ නගා ගැනීමට කතිකාවතක් අවශ්‍යය. සම්බුද්ධත්ව ජයන්තිය මේ සියලු කාරණා විද්වත්ව විමසිල්ලෙන් සාකච්ඡා කරන්නටත් ඒ වෙනුවෙන් සංවාදයක් ගොඩනගන්නටත් සුදුසුම කාලසීමාවයි. ගෞරවණීය මහා නායක හිමිපාණන් වහන්සේලාගේ උපදෙස් මත දැනුම් තේරුම් ඇති ධර්මධර සංඝයාවහන්සේලා හා වියත් ගිහි පිරිස විශේෂ කමිටුවක් වශයෙන්

එකතු වී, සාකච්ඡා කර ක්‍රියාකාරී විධිමත් සැලැස්මක් යෝජනා කළ යුතුය. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සැමරීමේ නියම අරුත තහවුරු කිරීමකි.